**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**--------------------------------**

## 01. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 07 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට තිරප්පනේ ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**----------------------------------------**

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම රු.983,747 ක් වුවත් ගිණුම්ගත වටිනාකම රු.750,048 ක් වූයෙන් රු.233,699 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ තොරතුරු අනුව 2014 වර්ෂයට අදාළව සභාවට අයවිය යුතු රු.679,990 ක් වූ මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සභාවට අයත් ලබුනෝරුව මහජන පුස්තකාලයේ රු.428,146 ක්වූ පුස්තකාල පොත් 1948 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.364,750 ක් වූ කාර්යාල උපකරණවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සභාවේ පිළිසරු ව්‍යාපෘතිය සඳහා ඉදිකර තිබෙන එකතුව රු.5,572,026 ක් වූ ගොඩනැගිලි, ජල සැපයුම හා ආරක්ෂිත වැට යනාදි වත්කම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**1.3.2 නොසැසඳුනු පාලන ගිණුම්**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය අනුව මුළු වත්කම් වටිනාකම රු.70,686,864 ක්වූ අතර මුළු හිමිකම් හා වගකීම් වටිනාකම රු.47,116,538 ක් වූයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි රු.23,570,326 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.394,697 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය 336,098 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 බදු කුලී**

සභාව සතු කඩකාමර බදුගෙන තිබුණු බදුකරුවන් 21 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයවිය යුතුව තිබුණු බදු මුදල රු.411,068 ක් වූ අතර, ඉන් රු.254,350 ක් 2012 වර්ෂයට පෙර සිට අයවිය යුතු මුදලක් වූ අතර, මෙම හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**2.2.2 උසාවි දඩ**

2013 සිට 2015 වර්ෂය දක්වා අයකර ගැනීමට තිබෙන රු.456,466 ක මුදල මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කර නොතිබුණු අතර, එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**2.2.3 මුද්දර ගාස්තු**

මුද්දර ගාස්තු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබෙන රු.1,058,890 ක්වූ මුද්දර ගාස්තු ආදායම අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

**2.2.4 වෙනත් ආදායම්**

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට බදු ඒකක 208 කින් අයවිය යුතුව තිබෙන රු.357,220 ක් වූ කසල බදු මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්වල පිරිවැටුම මත අයකරනු ලබන සියයට 1 බදු මුදල් ලෙස උලගල්ල රිසෝට් වෙතින් රු.300,000 ක බදු මුදලක් සමාලෝචිත වර්ෂයට අදාලව අයකර තිබුණු නමුත් එම හෝටල්යේ විගණනය කරන ලද ආදායම් වාර්තා ලබාගෙන නොතිබුණු බැවින් එම මුදල පිරිවැටුමෙන් සියයට 1 ක්ද යන්න තහවුරු කරගත නොහැකි විය.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**--------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී සභාවට ලැබී තිබෙන ට්‍රැක්ටර් රථයක් 2016 ජුනි මාසය වන විටද මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කිරීමකින් තොරව ධාවනය කරමින් පැවැති අතර සභාව සතු වාහන 05 ක් සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා සතු බල ප්‍රදේශය තුළ පිහිටි සුසාන භූමි 52 කට අදාළ භූමි ප්‍රමාණයන් හඳුනාගෙන අයිතිය විධිමත් පරිදි පවරා ගැනීමට හා මූල්‍ය ප්‍රකාශන සමග අදාළ තොරතුරු අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාලව අයකරගෙන තිබුණු රු.375,660 ක්වූ මුද්දර බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571ප්‍රකාරව වර්ෂ 2 ක කාලයක් ඉකුත්වී තිබෙන එකතුව රු.333,572 ක් වූ විවිධ තැන්පතු ශේෂ 16 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.2** **වත්කම් කළමනාකරණය**

**---------------------------**

**නිෂ්ක්‍රීය වත්කම්**

**-------------------**

වටිනාකම රු.568,500 ක්වූ සහල් පිටි නිෂ්පාදන උපකරණ කට්ටලය අරමුණුගත කාර්යයන්හි යෙදවීමට පියවර ගෙන නොතිබීම තුල එම උපකරණ වර්ෂ ගණනාවක් තිස්සේ නිෂ්ක්‍රීයව පැවතුණු අතර වටිනාකම හඳුනා ගෙන නොමැති යතුරුපැදි 03 ක් සහ ට්‍රැක්ටරයක් වර්ෂ ගණනාවක් තිස්සේ නිෂ්ක්‍රීයව පවතින අතර ඒවා සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීමට වගකිවයුතු පාර්ශවයන් පියවර ගෙන නොතිබුණි.

**3.3** **කොන්ත්‍රාත් පාලනය**

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පුලියන්කුලම ක්‍රීඩා පිටිය සැකසීම හා ක්‍රීඩාගාරයක් ඉදි කිරීම සඳහා රු.459,802 ක වියදමක් දරා තිබුණු අතර ක්‍රීඩා පිටිය වල්බිහිවී තිබීම මගින් ක්‍රීඩා පිටිය භාවිතයට නොගන්නා බව 2016 ජුනි 07 දින කරන ලද භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය වූ අතර ඉදිකර තිබුණු ක්‍රීඩාගාරයේ ඉදිකිරීම් කටයුතුද නිමකර නොතිබුණු බැවින් ක්‍රීඩාගාරයද භාවිතයට ගත නොහැකි මට්ටමක පැවතුණි.

(ආ) ගල්කුලම නිවාස 20 මාර්ගයේ කි.මී.1.5 ක් කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ අදාල මාර්ගය මෝටර් ග්‍රේඩර් කර බොරළු දමා තැලිම පමණක් සිදුකර තිබුණු අතර

ඇස්තමේන්තුගත මුදලින් රු.674,762 ක්වූ කොන්ක්‍රීට් දැමීම ඇතුළු ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කර නොතිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුදලින් අපේක්ෂිත අරමුණ ඉටුකර ගෙන නොතිබුණි.

(ඈ) 2015 සංවර්ධන වැඩසටහන (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන) පළාත් පාලන සංවර්ධන වැඩසටහන යටතේ ඇස්තමේන්තු වටිනාකම රු.2,753,469 ක් වූ ව්‍යාපෘති 14 ක් සැලසුම් කර තිබුණු අතර, රු.1,086,639 ක් වූ ව්‍යාපෘති 5ක් ක්‍රියාත්මක කර නොතිබුණි. වටිනාකම රු.1,233,421 අනෙක් ව්‍යාපෘති 6 ක් ද සම්පූර්ණ කර නොතිබුණි.

## 3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

2011 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.5,572,026 ක් වැයකර සහා බල ප්‍රදේශයේ ඉදිකර තිබුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය නිසිලෙස ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පරිසරයට හානිකර තත්ත්වයක් හා ගම් වැසියන්ගේ දෛනික ජීවන කටයුතු සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් උද්ගතවී ඇති බවට මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් විසින් 2016 අප්‍රේල් 27 දින සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය කර තිබුණි.

## 04. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය